# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල


| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1551/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி |
| දිනය<br>Date | 10/12/2023<br>පැය 1540 | | |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මාරක රිය අනතුරක් - කොලොන්න පොලිස් වසම.**

2023.12.09 වන දින සවස් කාලයේ කොලොන්න පොලිස් වසමේ බුලුතොට පල්ලෙබැද්ද මාර්ගයේ මොරයාය ප්‍රදේශයේදී පල්ලෙබැද්ද දෙස සිට බුලුතොට දෙසට ධාවනය කල බස් රථයක පදික කාන්තාවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව ඇඹිලිපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 85 ක් වූ හල්වින්න, ගොඩකවෙල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය ඇඹිලිපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කෙලොන්න පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - හබරාදුව පොලිස් වසම.**

2023.12.10 වන අද දින උදෑසන කාලයේ හබරාදුව පොලිස් වසමේ ගාල්ල මාතර මාර්ගයේ දළවැල්ල හන්දියේදී ගාල්ල දෙස සිට මාතර දෙසට ධාවනය වූ ත්‍රී රෝද රථයක් විරුද්ධ දිසාවෙන් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රීරෝද රථ රියදුරු කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 49 ක් වූ බෝපගේවත්ත, මිහිරිපැන්න ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. හබරාදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. මාරක රිය අනතුරක් - රක්වාන පොලිස් වසම.

2023.12.10 වන අද දින උදෑසන කාලයේ රක්වාන පොලිස් වසමේ ඕබොඩ කන්ද හොරමුල්ල වත්ත අතුරු මාර්ගයේදී ත්‍රී රෝද රථයක් රියදුරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයේ පෙරළී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ ත්‍රී රෝද රථ රියදුරු එම ස්ථානයේදීම මිය ගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 29ක් වූ රක්වාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කහවත්ත රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. රක්වාන පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**